




සිසිර දිසානායක

# මධු මල් පිපෙනා

"ගී සඳළුව" ලියවෙන්නේ ගීයක වටපිටාව පිළිබඳව යමක් කතා කිරීමටයි. ගීයකට මුල් වුණ හේතුව, එය නිර්මාණය වුණේ මොන ආකාරයට ද යන වග සොයා බලා පාඨක, රසික ඔබට ඉදිරිපත් කිරීමටයි, "ගී සඳළුව" ලිපිය උනන්දු වන්නේ. ඒ අනුව මෙවර "ගී සඳළුව" ලිපියෙන් ඇරයුම් ලබන්නේ ආචාර්ය වික්ටර් රත්නායකයන් විසින් ගායනා කළ "මධු මල් පිපෙනා" ගීතයයි.

''ෆේස් බුක්'' ප්‍රජා මාධ්‍ය ජාලයේ දර්ශන පෙළක් සමඟ පළ වුණ මෙම ගීතය මෑතක ආචාර්ය වික්ටර් රත්නායකයන් ගැයූ ගී අතරින් වැඩි රසික ප්‍රසාදයක් ලැබූ නිර්මාණයක් බව පෙනෙයි. ගීයේ පසුබිම් කතාවේ ද යම් රසවත් බවක් ඇති නිසා "ගී සඳළුවට" අදාල ගීයක් ලෙසින් "මධු මල් පිපෙනා" ගීතය නම් කළ හැකියි.

කාලයක පටන් ඕස්ට්‍රේලියාවට සංක්‍රමණය වන අපේ ජන ප්‍රජාව රිසි කලාංග දැනට නම් ඉතාම බහුලව සංවිධානය වෙයි. ඒ අතරින් සංගීත ප්‍රසංග මුලට ම ගැනෙයි. එහෙත් මීට 30 වසරකට පෙර?

මව් බිමෙන් මෙහි පැමිණෙන ප්‍රවීණ ගායන ශිල්පීන් හට වාදනයෙන් සහය දැක්වීමට ඉදිරිපත් වූ පුරෝගාමී චරිතයක් ලෙස කැමරන් කොළඹගේ ගිටාර් සහ සරපුවරු වාද්‍ය ශිල්පියා හඳුන්වා දිය හැකියි. එදා මෙදා තුර වසර 30 ක් පුරාවට සංගීතය සපයමින්, තනු සහ සංගීත නිර්මාණය කරමින් අපගේ ජන ප්‍රජාවට කළා වූ ස්වේච්ඡා සේවය අගයමින් අප්‍රේල් මාසයේ දී ප්‍රසංගයක් ද පැවත්විණ. ඒ "දස මස ඔබ මා" ප්‍රසංගයයි.

මව් බිමෙන් මෙහි පැමිණෙන, ප්‍රවීණයෙකුට සංගීතය සැපයීමට කැමරන්ට මුලින් ම අවස්ථාව ලැබුණේ ආචාර්ය වික්ටර් රත්නායකයන්ගේ ප්‍රසංගයක් වෙනුවෙන්. ඒ වසර 1987 දීයි. මෙරට අපරදිග වාද්‍ය කණ්ඩායම් කීපයක ම නිත්‍ය වාදකයකු ලෙස වෘත්තීය මට්ටමෙන් වාදනය කළ ද, කැමරන්ගේ රසඥතාවයත්, නිර්මාණත් බොහෝ විට අපගේ ගී රටාවන්ට ම අනුකූල විය. එනයින් කැමරන් "අදහන" ගායන ශිල්පියකු බවට ආචාර්ය වික්ටර් රත්නායකයන් පත් වීම අරුමයක් නොවෙයි.

කැමරන් කොළඹගේ ශිල්පියා අපගේ පද රචනා සඳහා යොමුවන්නේ සිය "තරංගා" ගායන කණ්ඩායමේ ගායිකා අසුන්තා කරුණාරත්න වෙනුවෙන් සංගීත තනුව හා සංගීතය නිර්මාණය කළ ගීතයකින්. පද රචනා කිරීම මූලිකව දෙයාකාරයකි. ලියූ ගීයකට තනුවකුත්, සංගීතයත් නිර්මාණය කිරීම පළමුවැන්නයි. පූර්ව නිර්මිත තනුවකට අනුව පද ලිවීම දෙවැන්නයි. ඉහත කී ලෙස ම අසුන්තා වෙනුවෙන් තමන් කලින් නිර්මාණය කළ කරගෙන තිබුණ තනුවකට මා ලවා පද ලියවාගැනීම කැමරන්ගේ අවශ්‍යතාවය විය. තනුවකට අනුව පද ලිවීම මා හට ඉගැන්වූයේ ආචාර්ය වික්ටර් රත්නායකයන් විසින් ඒ අනුව රත්නායකයන්ගේ තනුවකට අනුව ලියවුණ පළමුවැනි ගීතය පටිගත නොවීය. දෙවැන්න වූයේ සිය පුත් ලෙලුම් රත්නායක වෙනුවෙන් නිර්මාණය වූ "කිඳුරු සාදයේ" ගීතයයි. පූර්ව නිර්මිත තනුවකට අනුව පද ලිවීමේ හුරුව වඩාත් ප්‍රයෝජනවත් වූයේ ලයනල් රන්වලයන් සමඟ කළා වූ නිර්මාණ ගනුදෙනුවේදීයි. එය අදටත් සහන් රන්වලයන්ගේ ද ප්‍රමුඛතාවයයි. කැමරන්ගේ තනුවකට මා අසුන්තා වෙනුවෙන් ලියූ ගීතය "සිදංගනාවන්" ගීතයයි. ඉන් සතුටට පත් ඔහු දිගින් දිගටම මේ කටයුත්ත සඳහා මා දායක කර ගනිමින් සිටියි.

කැමරන් ඉතා ගෞරවයෙන් අදහන ආචාර්ය වික්ටර් රත්නායකයන් වෙනුවෙන් තනුවක් නිර්මාණය කිරීමට ඇති දැඩි කැමැත්ත මා වෙත කීවේ වසර හතරකට පමණ පෙරදීයි. රත්නායකයන්ට ඇති දැඩි ගෞරවය නිසාම තමන්ගේ තනුවකට රත්නායකයන්ට ගැයීම සඳහා ඇරයුම් කිරීමට කැමරන් පැකිළිණි. තමන්ගේ තනුවක් රත්නායකයන් ගයාවිදෝයි සැකයක් කැමරන් වෙත විය. මෙහිදී අතරමැදියා වීමට වූයේ මා හටයි. එය සතුටින් භාර ගත්තෙමි.
"කැමරන්ව අපි දන්නේ කොයි කාලේ ඉඳන් ද සිසිර?"
''අපේ මුල් ප්‍රසංග වල ඉඳන්ම අපට මොන තරම් උදව් කරලා තියෙනවා ද? ඒ විතරක් නෙවෙයි, කැමරන්ගේ තාත්තා අර්ල්රඩ් කොළඹගේ පැට්‍රික් දෙණිපිටියගේ කණ්ඩාය මේ ගිටාර් වාදනය කරන කාලෙ ඉඳන් අපි දන්නෙ. අපි අවිස්සාවේල්ලේ ගෙදරත් ගිහින් තියෙනවා. කැමරන් ට මෙලඩි එක එවන්න කියන්න...."

ඒ ආචාර්ය වික්ටර් රත්නායකයන්ගේ සුහදශීලී නිරහංකාර එකඟතාවයයි. සුපුරුදු පරිද්දෙන් කැමරන්ගේ ඒ තනුවට අනුව පද ලියන්නට අරයුම් ලැබුවේ මා යි. ඒ පද රචනාවයි. "මධු මල් පිපෙනා" ගීය බවට පත් වන්නේ. කැමරන් ගීතය භාර දීම සඳහා ආචාර්ය වික්ටර් රත්නායකයන්ගේ නිවසට යන්නේ මව් බිමට ගිය වෙලාවේදීයි. ඒ හිස් අතින්ම නොවේ. ගායනය වෙනුවෙන් ඩොලර් වලින් පිරුණ කවරයක් ද අතැතිවයි.

"සතයක් එපා. කෝ ගන්න බලන්න සින්දුව..."
ඒ රත්නායකයන්ගේ පිළිතුර වූ බැව් කැමරන් පැවසීය. ඒ මොහොතේ ප්‍රතාපවත් කැමරන්ගේ දෑසින් රූරා වැටුණ කඳුළු පිළිබඳව අපට දැන ගැනීමට ලැබුණේ ආචාර්ය වික්ටර් රත්නායකයන්ගෙනි. සංවේදී කලාකරුවන්ගේ සැටියයි, ඒ. කැමරන්ගේ තනුව වෙනුවෙන් සහ අපගේ පද වෙනුවෙන් රත්නායකයන් දැක්වූ ඒ සංවේදී ප්‍රතිචාරය සිහිවන මේ මොහොතේ දීත් දෙනෙත් කෙවෙණි තෙත් වෙයි.

පදවලටත් තනුවටත් ගායනයටත් වැඩි සාධාරණයක් ඉටු කරගැනීම සඳහා සරු සංගීත නිර්මාණයක් කරවා ගැනීමට කැමරන් අචාර්ය රෝහණ වීරසිංහයන්ට ඇරයුම් කරයි. අප සිතුවාටත් වඩා ඉහළ මට්ටමින් සංගීත මෙවලම් යොදමින් ඉතාම හැඟුම්බර සංගීත සංකලනයක් කරමින් ආචාර්ය රෝහණ වීරසිංහයන් ද "මධු මල් පිපෙනා'' ගීතයට දායක වන්නේ ය.

වික්ටර් අයියා ස්ටුඩියෝ එකට ආව වෙලා වේම "කෝ බලමු" කියලා "ගයිඩ්" එකට සින්දුව දෙපාරක් විතර මිමුණුවා. මං හිතුවා දැන් ඉතින් පටිගත කරන්න පුළුවන්නේ කියලා.
"රෝහණ අපි තේ එකක් බීලා ඉඳිමු නේ ද?" පුරුදු වුණ තාලය එක පාරටම ගයන්නේ නැතිව තේ බොන්න කතා කරපු එක මටත් හිතාගන්න බැරිවුණා... "

අප හා මේ පවසන්නේ ආචාර්ය රෝහණ වීරසිංහයන්. "තේ බොන ගමන් ආගිය තොරතුරු ටිකක් කතා කළා. හිටපු ගමන් ම "දැන් අපි යමු නේද වැඩේට?'' කියලා ඇතුලට ගියා. එක පාරින් ම එක හුස්මට සින්දුව ගායනා කළා..."

"ප්‍රොෆෙෂනල් ආටිස්ට් කෙනෙක් වෙන්න ඕන එහෙමයි." ඒ වීරසිංහයන්ගේ අදහස.

"මධු මල් පිපෙනා" ගීතය ආචාර්ය වික්ටර් රත්නායකයන් මෑත කාලීනව ගැයූ ගීත අතරින් තමුන් වඩාත් කැමති ගීතය බැව් හසිනි රත්නායක මහත්මිය අපට කීප වතාවක් ම පැවසූ බැව් මෙහි ලා සටහන් තබන්නේ මහත් සතුටින්. ඇය රත්නායකයන්ගේ නියම රසිකාවක බව අප හඳුනාගෙන ඇති නිසයි ඒ.

නිර්මාණයට ස්වේච්ඡාවෙන්ම දායක වූ සියළු දෙනාටම මෙන්ම ""ෆේස් බුක් ප්‍රජා මාධ්‍ය ජාලය වෙනුවෙන් හැඟීම් බර දර්ශන පෙළක් නිර්මාණය කරමින් එය පළ කළ හෂාන් ජයවර්ධන සොයුරාටත් ස්තූතිවන්ත වෙමින් "ගී සඳළුව" මේ වතාවට නිම වෙයි.

**මධු මල් පිපෙනා පෙම් උයනේ**
**මා තනි කරවා**
**පරසතුමල් පිපි දෙව් විමනේ**
**නුඹ ලතැවෙනවා**
**මධු මල් ඇතිරූ තනි යහනේ**
**මා නිදි කරවා**
**පර මල් විසිරුණු රන් සයනේ**
**නුඹ වැළපෙනවා..**

**කුඩා වියේ ලෙන්ගතුකම් කෙළි ලොල්ලේ**
**යෞවනයේ පෙම්බරකම් කුළුදුල්ලේ**
**ගෙවූ වසන්තයම රන් නැකතින්**
**නිමා වුණා දෝ?**
**රන් දොලාවක සැඟව ගියාදෝ?**

**දෙතැන වුණත් යළි හමුවන පැතුම් එපා**
**අහිමි වුණත් මා වෙනුවෙන් හැඬුම් එපා**
**ගෙවූ අතීතයම මගේ තනියට ළඟ උන්නාවේ**
**ඒ පෙම් සැමරුම් මගෙ ම වුණාවේ....**

ගායනය :ආචාර්ය වික්ටර් රත්නායක
සංගීතය : ආචාර්ය රෝහණ වීරසිංහ
තනුව : කැමරන් කොළඹගේ
රචලනය : සිසිර දිසානායක

